# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2157/22 - 2020 ජනවාරි මස 08 වැනි බදාදා - 2020.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල හා කාර්යයන් පහත උපලේඛනයේ දක්වා ඇති නිශ්චිත කාර්යයන් අධීක්ෂණය, ඉටුකිරීමේ වගකීම් හා බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල මැතිතුමා වෙත පවරනු ලබන බවත්, එසේම මෙම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් සොයා බැලීමේ, මැදිහත්වීමේ හා සම්බන්ධීකරණය කිරීමේ අවස්ථාව තවදුරටත් රාජ්‍ය අමාත්‍යවරයාට ඇති බවත් ප්‍රකාශයට පත් කරමි.

**ප්‍රසන්න රණතුංග,**
කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2020 ජනවාරි මස 07 වැනි දින.

**උපලේඛනය**

***ගරු කෙහෙළිය රඹුක්වැල්ල, ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය***

| *I වැනි තීරුව* *කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව* *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව* *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්* |
|---|---|---|
| 1. ආර්ථික සංවර්ධනයේ දී ආයෝජන ප්‍රවර්ධන සඳහා නව ක්‍රමෝපායන් සකස් කිරීම පිණිස අදාළ ආයතන සමග සම්බන්ධීකරණය කිරීම. | 1. 200 අංක 43 දරන පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු කර ඇති ඌන උපයෝජිත වත්කම්. | 1. ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත (2011 අංක 43) |

1A - G 31483 — 42 (2020/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

*ගරු කෙහෙළිය රඹුක්වැල්ල, ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය*

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණපනත්* |
|---|---|---|
| 2. 2011 අංක 43 දරන පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු කර ඇති ආයතනවල ඌන උපයෝජිත වත්කම්වල ආදායම් ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්ති, උපාය මාර්ග හා වැඩසටහන් සම්පාදනය කිරීම. | | |
| 3. 2011 අංක 43 දරන පනත යටතේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු කර ඇති ආයතනවල ඌන උපයෝජිත වත්කම් තුළ ආයෝජන කටයුතු සිදු කිරීම මගින් එකී ආයතන ලාභ උපයන ආයතන බවට පත් කිරීම. | | |
| 4. ආයෝජන මණ්ඩලයේ දැනට පවතින ආයෝජන ප්‍රවර්ධන කලාප උපරිම උපයෝජනය සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම. | | |
| 5. රජයේ ප්‍රමුඛ ක්ෂේත්‍රයන් වන කෘෂිකර්ම, සංචාරක හා තොරතුරු තාක්ෂණ ආදී ක්ෂේත්‍රයන්හි දේශීය හා විදේශීය ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම. | | |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.